# ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම

## පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2019

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| පාඨමාලාවේ කාලය | ඃ | මාස 12 යි. ( මසකට සති අන්ත 02 බැගින් ) |
| පාඨමාලාවේ ස්වභාවය | ඃ | සෙමෙස්තර ( Semester) 02 කින් පාඨමාලාව පැවැත්වේ |
| පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | ඃ | අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක |
| පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය | ඃ | සිංහල/දෙමළ |
| පාඨමාලා ගාස්තුව | ඃ | රුඃ 30,000/- කි ( සමාන වාරික 02 කින් ගෙවිය හැක ) |

### ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

❖ ඉල්ලුම්පත් කැඳවීම අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුවේ.

1. අවම වෘත්තීය සුදුසුකම් වශයෙන් පුහුණු ගුරු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සමඟ
2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ / විදුහල්පති සේවයේ/ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරියකු වීම හෝ පිළිගත් රජයේ හෝ අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙක් වීම.
3. අවම වශයෙන් අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් හා ඉන් අවම වශයෙන් එක් අවුරුද්දක පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද තිබීම ( පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද සහ සේවා වාර්තාව සම්මුඛ පරීක්ෂණයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් ලබාගත් ලිපියක් මගින් තහවුරු කළ යුතුයි)

### පාඨමාලාව සඳහා තෝරා ගැනීම

2. අයදුම්කරුවන් වෙනුවෙන් පවත්වනු ලබන අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පැය 02 ක ඇතුළත්වීමේ විභාගයක් මගින් ඉහළම ලකුණු ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් පාඨමාලාව සඳහා මූලික සුදුසුකම් පරීක්ෂා කර තෝරාගනු ලැබේ.

### අයදුම්පත් එවිය යුතු පිළිවෙළ

3. ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියෙන් (www.nie.lk) ලබාගත හැකි ආදර්ශ අයදුම්පත අනුව ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිත වූ ඉල්ලුම් පත්‍රයක්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගිණුම් අංක 7041168 ට පාඨමාලා ප්‍රවේශ විභාග ගාස්තු රුඃ 1,250/- ක් බැර කොට ලබා ගත් ලදුපත සමඟ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න. ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වුවහොත් ප්‍රවේශ විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

   අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
   අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,
   ජාතික අධ්‍යාපන ආයතනය,
   මීපේ හන්දිය, පාදුක්ක

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018 / 12 / 21
   අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ **“DSM 2019”** යනුවෙන් සඳහන් කළ යුතුය.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.